# මාක්ස්වාදී-ලෙනින්වාදී තුර්කි කොමියුනිස්ට් පක්ෂයට පණිවුඩයක්

ආදරණීය සොහොයුරනි,



මෙයට වසර 12 කට පෙර ප්‍රතිගාමී තුර්කි රජයේ අත් අඩංගුවට පත්ව සිටින අතරතුර ඊබ්‍රාහිම් කයිපක්කයා නිවට සහ බියසුළු ඝාතනයක ගොදුරක් විය. මරණය සිදුවන කාලය වන විට සහෝදර කයිපක්කයා ගේ වයස 24ක් පමණි. එසේ වුවද ඔහු තුර්කියේ විප්ලවීය ව්‍යාපාරයේ සංවර්ධනය වෙනුවෙන් ශ්‍රේෂ්ඨ දායකත්වයක් සපයා තිබුණි. නිර්ධන පංති විප්ලවයට න්‍යායිකව මෙන්ම භාවිතාවෙන්ද විශිෂ්ඨ දායකත්වයක් සැපයූ ගුරුවරයෙකු සහ නායකයෙකු අහිමි කර දැමීමක් වූ ඔහුගේ මරණය තුර්කියේ නිර්ධන පංති ජනතාවට සහ ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයට බලවත් පාඩුවක් විය.

ඔහු මිය ගොස් 12 වසරක් ඉකුත් වුවද තුර්කියේ සහ අනෙක් රටවල්වල දහස් ගණන් විප්ලවවාදී කොමියුනිස්ට්වාදීහු ඔහුට ගරු කිරීමෙන් සහ ඔහුගේ ඉගැන්වීම් වලින් ඉගෙන ගැනීමෙන් පෙනී යන්නේ සහෝදර කේපක්කයාගේ නිර්ධන පංති දෘෂ්ටියෙහි බලවත් බව අද පවා විදහා දැක්වෙන බවයි.

තුර්කියේ විප්ලවය වෙනුවෙන් සහෝදර ඊබ්‍රාහිම් කයිපක්කයා ලබා දුන් දායකත්වය ඔසවා තැබීම වූ කලී හුදෙක් ඓතිහාසික හෝ අධ්‍යයනික අභිලාශයක් නොව - එය දැඩි ලෙසම නිර්ධන පංති විප්ලවයේ ප්‍රගමනය උදෙසා වූ ජීවිතය සහ මරණය අතර වූ ගැටලු හා වෙලී පවතී.

සහෝදර ඊබ්‍රාහිම් කයිපක්කයා ගේ කෙටි නමුත් අතිශය වටිනා ජීවිතය 1960 වකවානුවේ විප්ලවීය මාක්ස්වාදය සහ ප්‍රතිවිප්ලවවාදී සංශෝධනවාදය අතර ලෝක පරිමාණයෙන් සිදුවූ අරගලය හා අනුකූලව බැඳී පවතී. සහෝදර මාඕ සේතුංගේ නායකත්වය සහ ඉහළ මට්ටමේ පෙළඹවීම යටතේ සහෝදර මාඕ මුල පුරන ලද සංස්කෘතික විප්ලවයට සහය දැක්වීමට ලෝකය පුරා විප්ලවවාදීහු සංශෝධනවාදයට එරෙහිව මතවාදී, දේශපාලනික සහ සංවිධානමය පෙරමුණු වල ප්‍රචණ්ඩ අරගලයක් ගෙන ගියහ. බොහෝ විට විප්ලවය සිදු කිරීම ගැන පවා වෙහෙසුණ දිගු කාලයක් තිස්සේ ජරා ජීර්ණ වුණු පැරණි සංශෝධනවාදී පක්ෂවලින් කැඩී ගොස් මාක්ස්වාදය-ලෙනින්වාදය-මාඕ සේතුං චින්තනය මත පදනම් වූ නව විප්ලවීය පක්ෂ නිර්මාණය කළහ.

තුර්කියේදී මේ ක්‍රියාවලිය සඳහා සෑම අංශයකින්ම නායකත්වය ලබා දුන්නේ සහෝදර ඊබ්‍රාහිම් කයිපක්කයා යි. ඔහු සංශෝධනවාදය ගැන, සියළු පෙරමුණු ශ්‍රේණි වල නිර්මල සහ අතිශය ප්‍රබල විවේචනාත්මක විග්‍රහයක් සංවර්ධනය කළහ, තව දුරටත් මේ දේශපාලනික දෘෂ්ටිය භාවිතාවේ යෙදවීමට නායකත්වය ගෙන - විශේෂයෙන්ම තුර්කි ඉතිහාසය තුළ පළමු වතාවට අව්‍යාජ මහජන යුද්ධය දියත් කිරීමට බරපතල වෑයමට මුල පිරූහ. සහෝදර ඊබ්‍රාහිම් කයිපක්කයා තුර්කිය තුළ සහෝදර මාඕ සේතුංගේ දෘෂ්ටිය ආරක්ෂා කළ අති විශිෂ්ඨ සහ උද්‍යෝගී ආරක්ෂකයා වූවා මෙන්ම, ශ්‍රේෂ්ඨ නිර්ධන පංතික සංස්කෘතික විප්ලවයේ ලෝක ඓතිහාසික වැදගත්කම සහ මාඕ සේතුං විසින් සිදු කරගෙන ගිය මාක්ස්වාදී-ලෙනින්වාදී විද්‍යාවේ සංවර්ධනය වේගයෙන් ග්‍රහණය කර ගත්හ. මේ කාරණයන්ගෙන් ඊබ්‍රාහිම් කයිපක්කයා ජීවත්ව සිටියදී මෙන්ම මිය ගියාට පසුවද විප්ලවයට එදිරි සෑම වර්ගයකම සතුරන්ගේ ඉලක්කයක් බවට පත්ව තිබේ.

පෙනෙන්නට තිබෙන විප්ලවයේ සංවර්ධනයට එදිරි වන ඕනෑම අයෙකුට සහෝදර ඊබ්‍රාහිම් කයිපක්කයා ගේ මාවතට සෘජුව හෝ ලජ්ජා සහගත ලෙස පහර දීමට අවශ්‍ය වේ. අනෙක් අතට තුර්කියේ විප්ලවයේ ඉදිරි ගමන ඊබ්‍රාහිම් කයිපක්කයා ගේ මාවත ආරක්ෂා කිරීම හා බැඳී තිබෙන බව පෙනී යයි. සහෝදර කයිපක්කයාගේ අතිමහත් කීර්තිය නිසා ඔහුගේ උරුමය ආරක්ෂා කරන්නට යැයි ප්‍රකාශ කරන අතරතුර කුහක ලෙස ''වැරදි අඩුපාඩු'' ගැන විවේචනය කරන තමන් විසින්ම ''බොල්ෂෙවික්වරු'' යැයි කියා ගන්නා සමහරු සහ අනෙක් ද්‍රෝහීන් ඇත්තෙන්ම සෑම ආකාරයෙන්ම ඊබ්‍රාහිම් කයිපක්කයා ගේ මාවතට එරෙහිව ප්‍රහාරයන් දියත් කොට තිබේ.

මේ ''බොල්ෂෙවික්කාරයින්ගේ'' අධම තත්ත්වයේ කටයුතු ඔහුගේ මාවතේ නියමුවන් වන සෑම කෙනෙකුටම කරන පැහැදිලි අනතුරු හැඟවීමකි.

ඇත්තෙන්ම සංශෝධනවාදයෙන් කැඩී බලය අල්ලා ගැනීම සඳහා දියත් කළ ජනතා සන්නද්ධ අරගලය සිදුවිය හැක්කේ දුර්වල කම් සහ අඩුපාඩු සමගයි. නමුත් සත්‍ය වන්නේ සියල්ල අලුත් සහ නිවැරදි දෑ වන බවයි. විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරයේ (RIM) ප්‍රකාශනය දක්වන ආකාරයට:

''1960 කාලයේ සහ 1970 ට කලින්, බොහෝ රටවල ශ්‍රේෂ්ඨ මාක්ස්වාදී-ලෙනින්වාදී බලවේග චීනයේ සංස්කෘතික විප්ලවයේ බලපෑම යටතේ බහුජන කොටස් සමග සම්බන්ධව සන්නද්ධ විප්ලවීය යුධ ක්‍රියාවලියේ යෙදෙමින් ලෝක ව්‍යාප්ත විප්ලවීය නැගී සිටීමේ කොටස් කරුවන් වූහ. රටවල් ගණනාවකම, මිලේච්ඡ ප්‍රතිවිප්ලවීය මර්ධනය තිබියදීත් ජනගහණයෙන් සෑහෙන කොටස් විප්ලවයේ ධජය යටතේ පෙළ ගස්වා, මාක්ස්වාදී - ලෙනින්වාදී පක්ෂ පිළියෙල කොට ජනතාවගේ සන්නද්ධ බල ඇණි නිර්මාණය කිරීමට හැකිකම ලැබුණි. සැබෑ පූර්වගාමීන් විසින් කලින් නව මාක්ස්වාදී-ලෙනින්වාදී පක්ෂ ගොඩනැගීමේ සහ සන්නද්ධ අරගලය දියත් කිරීම සහ ඒවායේ ඇතිවූ මතවාදී සහ දේශපාලනික දුර්වලකම් ඔවුන් විසින්ම ප්‍රකාශ කිරීම අනිවාර්‍යණීය දෙයක් වූ අතර ඇත්තෙන්ම එම වැරදි සහ දුර්වලකම් අල්ලාගෙන අධිරාජ්‍යවාදීහු සහ සංශෝධනවාදීහු ''අති වාමාංශිකවාදීන්'' හෝ වඩා නරක ලෙස පරිභව කිරීම පුදුම විය යුතු කරුණක් නොවේ. අනෙක් අතට සාමාන්‍යයෙන් මේ අත්දැකීම් ඉහළ ප්‍රගමනයක් සඳහා පදනම දැමීමට ආධාර වුණු මාක්ස්වාදී-ලෙනින්වාදී ව්‍යාපාරයේ වටිනා උරුමයක කොටස් ලෙස ඔසවා තැබිය යුතුය.'' සහෝදර ඊබ්‍රාහිම් කයිපක්කයා ගේ විශිෂ්ඨ දායකත්වය සම්පිණ්ඩනය කිරීමට ඇති එකම නිවැරදි දෙය එවැනි ආකල්ප සහ මුලපරීම් පමණි.

සහෝදරවරුණි, අද සෑම රටකම විප්ලවීය ව්‍යාපාරය දැඩි අනතුරක සහ දැඩි අවස්ථාවාදය යන මේ දෙක සමග සංයුක්ත වුණු ලෝක තත්ත්වයක ගැට ගැසී ඇත. ලෝක යුද්ධයක අනතුර පිළිබඳ තර්ජනය මතු වුවද විප්ලවීය අරගලයේ වර්ධනය නැවත නැගී සිටියි. මෙය අව්‍යාජ මාක්ස්වාදී-ලෙනින්වාදී බලවේග වලට, වත්මන් කාල පරිච්ඡේදය තුළ ඇති අභියෝග සහ අවස්ථාවන්ට මුහුණ දීම සඳහා නැගී සිටීමට සහ ඔවුන්ගේ වගකීම් සපුරා ලීමට ප්‍රබල වගකීමක් පවරයි.

තුර්කියේ ෆැසිස්ට්වාදී පාලනය ජනතාව සහ විප්ලවීය බලවේග වලට භීෂණකාරී ආධිපත්‍යයක් පවත්වාගෙන යයි. ඊබ්‍රාහිම් කයිපක්කයා ගේ අනුගාමිකයින් සහ මාක්ස්වාදී-ලෙනින්වාදී තුර්කි කොමියුනිස්ට් පක්ෂය දඩයම් කිරීම සහ ලුහුබැඳීම සිදු කරගෙන යන අතර සහෝදරවරු විශාල සංඛ්‍යාවක් දිවි පුදනු ලැබ හෝ සිරගත කොට ඇත. අනෙක් අතට ෆැසිස්ට් පාලනයේ කිසිම හරයක් නැත. ඇත්තෙන්ම ඔවුන්ගේ භීෂණය ජනතාව කෙරෙන් ඔවුන්ගේ හුදෙකලා බව සඳහා වන ප්‍රතිචාරයකි. සෑම තැනකම ප්‍රතිගාමී පාලනයන් තිබුණද, කලාපයේ තත්ත්වය විමුක්තිය සඳහා වන ජනතා අරගලවලට වාසිදයක ලෙස වැඩි වෙමින් තිබේ. ප්‍රතිගාමී පාලනයන් පරාජයට පත් කළ හැකි වනු ඇත! දිගු කාලීන ජයග්‍රහණය පිළිබඳ අභිලාශය රැගෙන යාමට ඊබ්‍රාහිම් කයිපක්කයා විසින් පාදන ලද මාවත දිගේ ඉදිරියට යාම දිගටම පවත්වාගැනීම අවශ්‍ය වන දෙයකි.

විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරය නිර්මාණය කිරීමෙන් නියෝජනය කෙරුණ ලෝක නිර්ධන පංතියේ ශ්‍රේෂ්ඨ ඉදිරි ගමන සහ ජයග්‍රහණය දැකීමට සහෝදර ඊබ්‍රාහිම් කයිපක්කයා ජීවත් නොවීය. විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරය මාක්ස්, එංගල්ස්, ලෙනින්, ස්ටාලින් සහ මාඕ සේතුං ගේ උරුමක්කාරයින් වන අනෙක් මාඕවාදී බලවේග සමග එක්ව සිටී. මේ ව්‍යාපාරය පිහුටුවීම වූ කලී ලෝකය පුරා සිටින පීඩිත සහ නිර්ධන පංතික ජනතාවගේ අරගලයෙහි මාහැඟි ඵලයකි. තුර්කියේ නිර්ධන පංතික සහ පීඩිත ජනතාවගේ සහ ඊබ්‍රාහිම් කයිපක්කයා ගේ සහ ඔහුගේ අනුප්‍රාප්තිකයින්ගේ අරගලයෙහි අත්දැකීම් ලෝකයේ විවිධ පැතිවල අරගලයන් සමග පරාවර්තනය වේ, මාක්ස්වාදී-ලෙනින්වාදී තුර්කි කොමියුනිස්ට් පක්ෂය (TKP/ML) විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරයේ ප්‍රකාශනයට අත්සන් තැබුවෙක්ද වේ.

බොහෝ කලක් මාවත හරි හැටි නොදැන සිටි විප්ලවීය නිර්ධන පංතියට අද එහි මතවාදී, දේශපාලනමය සහ සංවිධානමය එක්සත් බව වර්ධනය කිරීමට හැකිවී තිබේ. ඇත්තෙන්ම ප්‍රකාශනය ඉදිරිපත් කරන ආකාරයට ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්ණය තවම විසඳා නැත. එසේ වුවද වංගුව හැරී තිබෙන අතර දිගටම සිදුවුණු කොටස්වලට කැඩීමේ සහ පිරිහීමේ ක්‍රියාවලිය වෙනුවට ඉහළ මට්ටමේ එක්සත්කමක් සහ විප්ලවීය බලවේගවල වර්ධනය ස්ථානගත කොට ඇත.

විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරය තුළ සිය සහභාගීත්වය සාඩම්බර ලෙස ප්‍රකාශ කළ පීරු කොමියුනිස්ට් පක්ෂය (PCP) විසින් පීරුව තුළ නායකත්වය දෙනු ලබන සන්නද්ධ විප්ලවීය අරගලයේ වේගවත් සහ ජීවමය වර්ධනය මේ සඳහා වැදගත් තහවුරු කිරීමකි. මෙම වටිනා විප්ලවීය අරගලයට සහය දීම සහ එමගින් ඉගෙන ගැනීම සෑම රටකම විප්ලවීය කොමියුනිස්ට්වාදීන්ගේ වටිනා කාර්යභාරයකි.

සහෝදරවරුනි, සහෝදර කයිපක්කයාට ට ගෞරවය පුද කළ හැකි විශිෂ්ඨතම ක්‍රමය වන්නේ ධෛර්ය සම්පන්න ලෙස විප්ලවීය මාවත දිගේ ඉදිරියට ගමන් කිරීම සහ එය ආරක්ෂා කිරීමයි. මාක්ස්වාදය-ලෙනින්වාදය-මාඕ සේතුං

චින්තනය වූ කලී මාවතේ ඉදිරි ගමන පැහැදිලි කරන ප්‍රධාන මාලිමාවයි. විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරයේ ප්‍රකාශනය මගින් කැටයම් කර දක්වන මූලික දිශානතිය එයයි. උත්සාහවන්ත ලෙස මේ මාවත තුළ ගමන් කරමින්, ලෝක  පරිමාණයෙන් නිර්ධන පංතියේ සමගිය සහ සෑම රටකම සිටින එහි බලමුළු ශක්තිමත් කිරීමෙන් සහ අතීත පාඩම් බලවත් පරිශ්‍රමයෙන් යුතුව ග්‍රහණය කර ගැනීමෙන් අපට විජයග්‍රාහීව ඉදිරියට ගමන් කළ හැකි වේ!

**සහෝදර ඊබ්‍රාහිම් කයිපක්කයාගේ අනුස්මරණය දිගු කල් දිනේවා!**

**මාක්ස්, එංගල්ස්, ලෙනින්, ස්ටාලින් සහ මාඕගේ රක්ත වර්ණ මාවත දිගු කල් දිනේවා!**

**ලෝකයේ කම්කරුවනි, පීඩිත ජනතාවෙනි සමගි වව්!**

1985 පළ කළ ''දිනා ගැනුමට ලොවක් ඇත'' (A world to Win) හි 3 වන කලාපයේ 34, 35 යන පිටුවල පළ වූ Message to TKP/ML යන ලිපියේ පරිවර්තනයයි. මෙය විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරයේ කොමිටිය මගින් තුර්කි කොමියුනිස්ට් පක්ෂයට යවන ලද්දකි.

**NMSG පරිවර්තනයකි**

**T# 22**

slmarxist.yolasite.com

slradical@ymail.com